නිකායටම අයත් සාමණේර භික්ෂූන් වහන්සේගේ උපසම්පදා පුණ්‍ය කර්මය උපසම්පදා භික්ෂූන් වහන්සේලාගේ සංඝාදිසේස - නිස්සග්ගි - පචිත්සේඛියා - දුක්කට - දුබ්භාසිත වැනි කුඩු මහත් වැරදි අඩුපාඩු සන්සිඳීමට ආයති සංවරයෙහි පිහිටීම සඳහා අවශ්‍යවත් මානත් අබ්භාන විනය කර්ම සිදුකිරීම ද වස්සාන කාලය ආරම්භ වන හෙයින් ඊට සුදුසු විහාරස්ථානයක හෝ වන සෙත්සුනක වස් වැසීමටද සිදුවේ.

එහිදී වස් වැසීමට ආරාධනා කළ සතර පේරුවේ දායක - දායිකාවන්ගේ මෙලොව යහපත සඳහා පරලොව යහපත් සඳහා තුන් භාරමාසයක් පුරා විශේෂ බුද්ධ පූජා බෝධි පූජා - තෙසැත්තෑශ්‍රදාන පූජා අසූ මහා ශ්‍රාවක පූජා ධර්ම දේශනා ආදියද පැවැත්වීම විශේෂයෙන් වැදගත්ය. අනතුරුව වස් අවසානයේදී වසරකට එක් වරක් පමණක් කළහැකි අටමහ කුසල්වලට අයත් කඨින චීවර මහා පූජාවද අති උත්කර්ෂවත් අන්දමින් සිදු කෙරේ.

එදින ඊට කලින් රාත්‍රියේ අලුයම් කාලයේදී ගම වටා කඨින චීවරය රැගෙන යන දර්ශනීය පෙරහැරද එක් ගන්නා සුලුය. නොයෙකුත් කෙළි සෙල්ලම් බාල - තරුණ - මහළු හැම කෙනෙක්ම



සහභාගි වී අලුයම හයට පමණ තම තමන්ගේ විහාරස්ථානවලට ගොඩවැදී වස් වැසූ භික්ෂූන් වහන්සේලාට එම කඨින චීවරය සැදැහ ස්ත්‍රින් අපමණ ගෞරවාදර භක්තියෙන් පූජාකර ධර්මදේශනාවට සවන් දී නිවෙස් කරා ගමන් කරති. වෙහෙස නිවාගෙන සවස් කාලයෙහි කඨිනානිසංස ධර්ම දේශනාවට සවන් දීමට ද පැමිණෙන දවල් කාලයෙහි භික්ෂු මහා සංඝයා වහන්සේට සාංඝික කොට දන් දීමට කඨින මහා චීවරය සඟ සතු කොට පූජා කිරීමට ද අමතක නොකරති.

සිදුහත් කුමරුගේ මව්කුස පිළිසිඳ ගැනීම මහා අභිනිෂ්ක්‍රමණය සිදුවූයේ ඇසළ මස පුර පසළොස්වක පොහොය දවසකය.

තවත් කිවයුතු විස්තර කළ යුතු බොහෝ තරුණ ඇතත් ඒ සියල්ලක්ම විස්තර කිරීමට මේ සුදුසු කාලය නොවේ.

නොයෙකුත් ගිහි කම් කටොළුවලින් පිරී ඉතිරී ගිය සැදැහවතුන්ට විවිධ රෝග පීඩා - දරුවන්ගේ අධ්‍යාපන කටයුතු රැකී රක්ෂා කටයුතු ඥාති හිතෛෂීන්ගේ කටයු දේශගුණ නිසා දීර්ඝ ලිය කියවිලි කියවීමට ඒ වෙනුවෙන් කාලය ගත කිරීමට අපහසු නිසා අදට මෙයින් නැවතීමට සුදුසු බව හැඟේ.





